# පුරප්පාඩු දැන්වීමයි

## බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## මධ්‍යම සංස්කෘතික අරමුදල

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුරප්පාඩු වී ඇති පහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් වෘත්තිකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්මික සහකාර තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව 07)

| | |
|---|---|
| වැටුප් පරිමාණය | MA 2-2 රු. (30,310-10 x 300-7 x 350-4 x 600-20 x 710 - 52,360)<br>(ක.සේ.චක්‍රලේඛ අංක 2/2016) |
| වයස් සීමාව | වයස අවුරුදු 18 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

- **අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

I. සිංහල/ දෙමළ
II. ගණිතය

සහ

III. තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම

(ඇ) තාක්ෂණික නිපුණතා/ ප්‍රවීණතා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) සහතිකය (NVQ - 05 මට්ටමට නොඅඩු) ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය මගින් ජාතික තාක්ෂණික (NVQ - 05 මට්ටමට නොඅඩු) සහතිකය (සිවිල්/ විදුලි) සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 04 කට නොඅඩු පශ්චාත් පළපුරුද්දක් ලබා තිබීම.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය**

තරඟ විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

- **පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිත

## පොදු සුදුසුකම්

සෑම අපේක්ෂකයෙක්ම,

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**වෙනත්**

රජයේ, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් සමග තනතුරට තෝරා ගතහොත් නිත්‍ය තනතුරින් නිදහස් කරන බවට තම ආයතන ප්‍රධානීන්ගේ එකඟතාව ඇතුළත් ලිපියක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.)

මේ සඳහා ඉදිරිපත් වීමට අභිලාෂය පළකරන අයදුම්කරුවන් www.ccf.gov.lk/notice වෙබ් අඩවි මගින් බාගත කරනු ලබන අයදුම්පත් සම්පූර්ණ කර තමාගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පිටපත් ද සමඟ 2024.06.18 දිනට පෙර ලැබෙන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල, 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් පමණක් එවිය යුතුය. අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර නිවැරදිව සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
මධ්‍යම සංස්කෘතික අරමුදල
කොළඹ 07.

©SELACINE